ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව
சமுதாயஞ்சார் சீர்திருத்தத் திணைக்களம்
Department of Community Based Corrections

වාර්ෂික කාර්ය සාධන වාර්තාව
வருடாந்த செயலாற்றுகை அறிக்கை
Annual Performance Report

2025

වාර්ෂික කාර්ය සාධන වාර්තාව
செயலாற்றுகை அறிக்கை
Annual Performance Report

2025

ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව
சமுதாயஞ்சார் சீர்திருத்தத் திணைக்களம்
Department of Community Based Corrections

15 වැනි මහල
“මෙහෙවර පියෙස”
නාරාහේන්පිට
කොළඹ–05

15 ஆவது மாடி
“மெஹெவர பியெஸ”
நாராஹேன்பிட்டி
கொழும்பு- 05

15th floor
“Mehewara Piyasa”
Narahenpita
Colombo- 05

011-2683691
www.dcbc.gov.lk
dcbcorrection@gmail.com

කොමසාරිස්තුමාගේ පණිවිඩය

වරදින් මිදුණු යහපත් පුද්ගලයෙකු බිහිකිරීම සිය දැක්ම කරගත් ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව 1999 අංක 46 දරණ ප්‍රජා පාදක විශෝධන පනත මඟින් ස්ථාපනය කරන ලද රාජ්‍ය ආයතනයකි.

2025 වර්ෂය තුළදී නියෝගලාභීන් 19,203 ක් පමණ මහේස්ත්‍රාත් අධිකරණ මඟින් ප්‍රජා විශෝධනය සඳහා යොමු කර ඇති අතර 2025 වර්ෂයට පෙර වර්ෂවලින් ඉදිරියට ආ නියෝගලාභීන් ද ඇතුළුව 27,610ක ප්‍රමාණයක් සම්බන්ධව දෙපාර්තමේන්තුව කටයුතු කර ඇත.

බන්ධනාගාර තදබදයට විකල්පයක් ලෙස ස්ථාපනය කරන ලද මෙම දෙපාර්තමේන්තුව වෙත අධිකරණ මඟින් යොමු කරන ලද වරදකරුවන්ගෙන් කඩකිරීම් අවම මට්ටමක පවත්වා ගනිමින් අදාළ නියෝග කාල සීමාව තුළ ඔවුන් වෙනත් වරදක් සිදුකිරීමෙන් වළක්වා ගැනීමට අපගේ නිලධාරීන් සමත්ව ඇත.

අධිකරණ මඟින් යොමු කරනු ලබන නියෝගලාභීන්ගෙන් 81% ප්‍රමාණයක් මත්ද්‍රව්‍ය හා නීති විරෝධී මත්පැන් වැරදි කරුවන් වන අතර ඊට අමතරව සූදුව, සොරකම, රථවාහන වැරදි, ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය, පාරිසරික වැරදි ආදී වූ වෙනත් වැරදි සම්බන්ධයෙන් ද ප්‍රජා විශෝධන නියෝග යටතට පත්කෙරේ.

විශේෂයෙන් මත්පැන් හා මත්ද්‍රව්‍ය ආශ්‍රිත වැරදිකරුවන් සඳහා විශෝධන නියෝග ක්‍රියාත්මක කිරීමේදී ASSIST අනාවරණ පරීක්ෂණය සිදුකරන අතර සියළු නියෝගලාභීන් සඳහා ආකල්ප හා පෞරුෂත්ව සංවර්ධන වැඩසටහන්, ප්‍රතිකාරාත්මක, උපදේශන, වෘත්තීය පුහුණු, ස්වයං රැකියා, රැකියාගත කිරීම් යනාදී අංශ කෙරෙහි අවධානය යොමු කරන අතර නව ලෝක ප්‍රවණතාවයන් පිළිබඳ අවධානය යොමුකරමින් ක්‍රීඩාමය ක්‍රියාකාරකම්, සෞන්දර්ය, සාක්ෂි පාදක ප්‍රතිකාර ආදී වූ ක්‍රම ශිල්ප භාවිතා කෙරේ.

විශෝධන ක්‍රියාවලිය අප දෙපාර්තමේන්තුවට පමණක් සීමා නොවී මානසික සෞඛ්‍ය විද්‍යායතන, පොලිස් දෙපාර්තමේන්තුව, අන්තරායකර ඖෂධ පාලක ජාතික මණ්ඩලය, වෘත්තීය පුහුණු ආයතන ආදී රාජ්‍ය හා රාජ්‍ය නොවන විවිධ ආයතන රැසකගේ සම්පත් දායකත්වය හා මැදිහත්කරණය ලබාගැනීම ඵලදායී බව වැඩිකර ගැනීමට උපකාරී වී ඇත.

තවද, විශේෂයෙන් මෙම වසර තුළ ක්‍රීඩා අමාත්‍යාංශය, ප්‍රජා පොලිස් ඒකක සමඟ සම්බන්ධීකරණය කර ගනිමින් නව ප්‍රවේශයක් වෙත යොමුවීමට උත්සාහ ගනිමින් සිටී. දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය සඳහා උපදේශණය විශෝධනය හා සමාජ වැඩ විෂයයේ දැනුම වර්ධනය වෙනුවෙන් වර්ෂය පුරා පුහුණු වැඩමුළු ක්‍රියාත්මක කෙරේ. දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ අභිප්‍රේරණය සඳහා මුල් අදියරේදී කාර්යාල කළමනාකරණ ඇගයීම් වැඩසටහනක් සබරගමුව, ඌව හා මධ්‍යම පළාත් ත්‍රිත්වයේ 2025 වර්ෂ තුළ ක්‍රියාත්මක කර ඇති අතර 2026 වර්ෂයේදී බස්නාහිර හා දකුණු පළාත් තුළ මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වේ.

මීට අමතරව දෙපාර්තමේන්තුව වෙත යොමු වන තරුණ වරදකරුවන් වෘත්තීය පුහුණු අවස්ථා වෙත යොමු කිරීමට මෙන්ම රැකියාගත කිරීම් කෙරෙහිද සාර්ථකව විශෝධනය වූ තැනැත්තන් සඳහාද ස්වයං රැකියා ආධාර ලබා දීම , අවධානම් සහනාධාර හා දරුවන් සඳහා අධ්‍යාපන ආධාර ලබා දීම ද සිදු කෙරේ.

දිලාන් ගුණරත්න
ප්‍රජා පාදක විශෝධන කොමසාරිස්
ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව

2025 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව

ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව

වැය ශීර්ෂ අංකය 326

අන්තර්ගතය

පරිච්ඡේදය	**01**	**-**	**ආයතනික පැතිකඩ/ ක්‍රියාවට නැංවීමේ සාරාංශය**
පරිච්ඡේදය	**02**	**-**	**ප්‍රගතිය හා ඉදිරි දැක්ම**
පරිච්ඡේදය	**03**	**-**	**වසරේ සමස්ත මූල්‍ය කාර්ය සාධනය**
පරිච්ඡේදය	**04**	**-**	**කාර්ය සාධන දර්ශක**
පරිච්ඡේදය	**05**	**-**	**තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය**
පරිච්ඡේදය	**06**	**-**	**මානව සම්පත් පැතිකඩ**
පරිච්ඡේදය	**07**	**-**	**අනුකූලතා වාර්තාව**

පටුන පිටු අංකය

01 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ ක්‍රියාවට නැංවීමේ සාරාංශය......................1

1.1 හැඳින්වීම 1

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර 1

1.3 අරමුණු, ප්‍රධාන කාර්යයන් 2

1.4 සංවිධාන සටහන 3

02 පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම 4

2.1 කාර්ය සාධනයට අදාළ තොරතුරු 4

2.2 සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය (2025.01.01දින සිට 2025.12.31 දක්වා)....................8

2.3 එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ ආයතනය (UNODC) මගින් ප්‍රජා පාදක විශෝධනය පිළිබඳව ගරු විනිසුරුවරුන්ගේ දැනුවත්භාවය වර්ධනය කිරීම...........9

2.4 ඉලක්ක 11

03 පරිච්ඡේදය - මූල්‍ය කාර්ය සාධනය 12

3.1 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය.......12

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය 13

3.3 2025.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය 14

3.4 මූල්‍ය සටහන් ප්‍රකාශය 15

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය..16

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය..........................16

3.7 මු .රෙ.208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ /දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන..................................17

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය 17

3.9 විගණකාධිපතිගේ වාර්තාව 18

04 පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශකය 25

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශකය(ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව).....................25

05 පරිච්ඡේදය - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය 26

5.1 හඳුනා ගන්නා ලද තිරසාර සංවර්ධන අරමුණු ඉලක්කය - 26

06 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ 27

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය 27

6.2 කාර්ය මණ්ඩල තොරතුරු...27

6.3 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය බලපාන ආකාරය............28

6.4 මානව සම්පත් සංවර්ධනය...29

07 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව 30

01 පරිච්ඡේදය - ආයතනික පැතිකඩ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1 හැඳින්වීම

1999 වසරේදී අධිකරණ අමාත්‍යාංශය යටතේ නියමු ව්‍යාපෘතියක් ලෙස ශ්‍රී ලංකාව තුළ ප්‍රජා විශෝධන ක්‍රියාවලිය ආරම්භ කරන ලදි. 1999 අංක 46 දරන ප්‍රජා විශෝධන පනත යටතේ අධිකරණ 3කින් ආරම්භවූ නියමු ව්‍යාපෘතිය මේ වන විට දිවයින පුරා සංචාරක අධිකරණ හා මහේස්ත්‍රාත් අධිකරණ 125ක ක්‍රියාත්මක වේ. සුළු වරදකරුවන් ප්‍රජා විශෝධන ක්‍රියාවලියට යොමු කිරීම තුළින් අධික බන්ධනාගාර තදබදය අඩු කිරීම හා එමගින් වරදකරුවන් නඩත්තුව සඳහා වැයවන අධික වියදම අවම කිරීම, සුළු වරදකරුවන් බන්ධනාගාර ගත කිරීම තුළින් සංවිධානාත්මක අපරාධකරුවන් බවට පත්වීමේ ඉඩකඩ වැළැක්වීම හා ඔවුන් වඩාත් ඵලදායී පුනරුත්ථාපන ක්‍රියාවලියකට යොමු කිරීම සිදු වේ.

අධිකරණයේ සුළු වරදකරුවකු වූ පුද්ගලයෙකුට ප්‍රජා විශෝධන ආඥාවක් ලබාදීම තුළින් අපේක්ෂා කරනුයේ ප්‍රජාව තුළම තබා ඔහුගේ වරදකාරී චර්යා රටාවෙන් මුදවා, යහපත් පුරවැසියකු බවට පත් කිරිමට අවශ්‍ය කටයුතු කිරීමයි.

මේ සඳහා මහේස්ත්‍රාත් අධිකරණවල පිහිටුවා ඇති ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුවේ ප්‍රාදේශීය කාර්යාලවලට අනුයුක්ත දෙපාර්තමේන්තු නිලධාරින් විසින් විවිධ විශෝධන වැඩසටහන් සිදුකරනු ලබයි. නිලධාරින්ගේ අධීක්ෂණය යටතේ කටයුතු කරන ආඥාලාභියා නිවැරදි මගට යොමුකිරිම දෙපාර්තමේන්තුවේ අපේක්ෂාවයි.

විශෝධන ක්‍රියාවලිය අවසන් කරන ලද පුද්ගලයින් පිළිබඳව පසුවිපරම් කිරීම කාලීන අවශ්‍යතාවක් වි ඇති බැවින්, ඒ පිළිබඳවද අවධානය යොමු කරමින් මෙම දෙපාර්තමේන්තුව විසින් ආරම්භයට වඩා දෙපාර්තමේන්තුවේ කාර්ය පරාසය පුළුල් කර ඇත. එම කාර්යයන් සිදුකිරීම සඳහා මහේස්ත්‍රාත් අධිකරණයන්හි පිහිටි ප්‍රාදේශීය ප්‍රජා විශෝධන කාර්යාලවල සේවයකරන ප්‍රජා විශෝධන නිලධාරී, වැඩ පරීක්ෂක නිලධාරීන්ට අමතරව දිවයින පුරා පිහිටි ප්‍රාදේශීය ලේකම් කාර්යාල සඳහා මෙම දෙපාර්තමේන්තුව මඟින් සංවර්ධන නිලධාරීන් අනුයුක්ත කොට ඇත.

1.2 ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

දැක්ම

වරදින් මිදුණු යහපත් පුරවැසියෙක්

මෙහෙවර

පසුවිපරමක් සහිත ඵලදායී ප්‍රජා විශෝධන ක්‍රියාවලියක් තුළින් සුළු වරදකරුවන් හා ඔවුන්ගේ පවුල් සමාජීය, ආර්ථික, අධ්‍යාත්මික හා මානසික වශයෙන් සංවර්ධනය කිරීම.

1.3 අරමුණු

1. 1999 අංක 46 දරන ප්‍රජා පාදක විශෝධන පනත ක්‍රියාත්මක කිරීම මඟින් සුළු වරදකරුවන් බන්ධනාගාරගත කිරීම වෙනුවට ඔවුන් ප්‍රජාව තුළ තබා විශෝධනය කිරීම
2. ප්‍රජා පාදක විශෝධන ආඥා ක්‍රියාත්මක කිරීම මඟින් සුළු වරදකරුවන් බන්ධනාගාරගත කිරීම අවම කර බන්ධනාගාර තදබදය අඩුකිරීම හා ඒ සඳහා වැය වන රජයේ වියදම අවම කිරීම
3. ප්‍රජා විශෝධන ආඥාලාභීන්ගේ ශ්‍රමය රටේ සංවර්ධනය සඳහා යොදා ගැනීම
4. ප්‍රජා විශෝධන ආඥාලාභීන් සහ ඔවුන්ගේ පවුල්වල මනෝ සමාජීය ගැටළු අවම කර ආර්ථික වශයෙන් ශක්තිමත් කිරීම
5. ඵලදායී ප්‍රජා පාදක විශෝධන ක්‍රියාවලියක් තුළින් සමාජගතවන සේවාලාභියා පිළිබඳ පසුවිපරමක් සිදුකර සාර්ථකත්වය මැන බැලීම

ප්‍රධාන කාර්යයන්

1. මහේස්ත්‍රාත් අධිකරණ මඟින් සුළු වැරදිකරුවන් වූ පුද්ගලයින් ප්‍රජා පාදක විශෝධන නියෝග සඳහා ඇතුළත් කිරීම
2. ආඥාලාභීන්ගේ අධ්‍යාත්මික සංවර්ධනය සඳහා අධ්‍යාත්මික සංවර්ධන වැඩසටහන් සංවිධානය කිරීම
3. ආඥාලාභීන්ගේ මානසික සෞඛ්‍යය වර්ධනය හා උපදේශන වැඩසටහන් සංවිධානය කිරීම
4. ආඥාලාභීන්ගේ විශේෂ හැකියාවන් හා ජීවන තත්ත්වය නඟා සිටුවීම සඳහා වෘත්තීය පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම හා රැකියාගත කිරීම.
5. ආඥාලාභීන්ගේ ආර්ථික තත්ත්වය නඟා සිටුවීම සඳහා විවිධ සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම
6. ආඥාලාභින් මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහිවූවන්, එම ඇබ්බැහිතාවයෙන් මුදවා ගැනීම සඳහා වෛද්‍ය ප්‍රතිකාරවලට යොමු කිරීම
7. පෞරුෂත්ව හා ආකල්ප සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

1.4 සංවිධාන සටහන



කොමසාරිස් -1
නියෝජ්‍ය/සහකාර කොමසාරිස් (මෙහෙයුම්) -2
නියෝජ්‍ය/සහකාර කොමසාරිස් (පාලන) - 1
ගණකාධිකාරී - 1
අභ්‍යන්තර විගණක - 1
ජ්‍යෙෂ්ඨ ප්‍ර.වි.නි - 9 (පළාත් කාර්යාල)
ජ්‍යෙෂ්ඨ ප්‍ර.වි.නි - 1 (ප්‍රධානකාර්යාලය)
පරිපාලන නිලධාරී - 1
භාෂා පරිවර්තක - 1
සංවර්ධන නිලධාරී (ප්‍රජා විශෝධන)
ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට අනුයුක්ත කර ඇති
ප්‍රාදේශීය කාර්යාල
ප්‍ර.වි.නි
වැඩ පරීක්ෂක
සංවර්ධන අංශය
සංවර්ධන නිලධාරී
කළමනාකරණ සේවා නිලධාරී
කා.කා.ස
පාලන අංශය
සංවර්ධන නිලධාරී
තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සහකාර
කළමනාකරණ සේවා නිලධාරී
ලිපිකරු
රියදුරු
කා.කා.ස
ගිණුම් අංශය
සංවර්ධන නිලධාරී
කළමනාකරණ සේවා නිලධාරී
ලිපිකරු
කා.කා.ස

02 පරිච්ඡේදය - ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 කාර්ය සාධනයට අදාළ තොරතුරු

අ) මහේස්ත්‍රාත් අධිකරණ මඟින් ලබා දුන් ආඥාලාභීන් සංඛ්‍යාව - පළාත් අනුව (2025.01.01– 2025.12.31)

අනු අංකය	පළාත	නියෝග ලැබූ ආඥාලාභීන් සංඛ්‍යාව
01	බස්නාහිර	6,066
02	උතුර	2,674
03	දකුණ	2,527
04	වයඹ	1,886
05	නැගෙනහිර	1,692
06	සබරගමුව	1,579
07	මධ්‍යම	1,226
08	ඌව	904
09	උතුරු මැද	649
	එකතුව	**19,203**

ආ) මහේස්ත්‍රාත් අධිකරණ මඟින් ලබා දුන් ආඥාලාභීන් සංඛ්‍යාව - වරද අනුව (2025.01.01 – 2025.12.31)

අනු අංකය	වරද	නියෝග ලැබූ සංඛ්‍යාව
01	නීතිවිරෝධී මත්පැන්	5,850
02	හෙරොයින්	3,844
03	මෙතැම්පිටමින් (අයිස්)	2,892
04	ගංජා	2,260
05	රථවාහන වැරදි	1,911
06	සූදුව	638
07	බීමත්ව අශෝභන ලෙස හැසිරීම	476
08	සොරකම්	183
09	ගෘහස්ත ප්‍රචණ්ඩත්වය	124
10	මහජන සාමය කඩකිරීම්	114
11	පාරිසරික වැරදි	67
12	සොරබඩු ලඟතබා ගැනීම	39
13	නීතිවිරෝධී අවි ආයුධ ලඟතබා ගැනීම	18
14	වංචා	8
15	කැරලිකෝලහාල	8
16	වෙනත්	771
	එකතුව	**19,203**

මහේස්ත්‍රාත් අධිකරණ මඟින් ලබා දුන් ආඥාලාභීන් - පළාත් අනුව
(2025.01.01 – 2025.12.31)



මහේස්ත්‍රාත් අධිකරණ මඟින් ලබා දුන් ආඥාලාභීන් - වරද අනුව
(2025.01.01 – 2025.12.31)



ඇ) විශෝධන ආඥා පිළිබඳව තොරතුරු - (2025.01.01 සිට 2025.12.31 දක්වා)

ලබා දී ඇති ආඥා සංඛ්‍යාව (a)	ආඥාව අවසන් කරන ලද ආඥාලාභීන් සංඛ්‍යාව හා එහි ප්‍රතිශතයක් ලෙස		ලබා දී ඇති ආඥාලාභීන්ගෙන් ආඥා කඩ කළ සංඛ්‍යාව		තව දුරටත් ක්‍රියාත්මක වන සංඛ්‍යාව	
	සංඛ්‍යාව (b)	ප්‍රතිශතය (b/a%)	සංඛ්‍යාව (c)	ප්‍රතිශතය (c/a%)	සංඛ්‍යාව (d)	ප්‍රතිශතය (d/a%)
19,203	7,482	39%	3,120	16%	8,601	45%

ඉ) පවත්වන ලද විශෝධන වැඩසටහන් පිළිබඳව තොරතුරු
(2025.01.01 සිට 2025.12.31 දක්වා)

අනු අංකය	වැඩසටහන	වැඩසටහන් සංඛ්‍යාව	පුද්ගලයින් සංඛ්‍යාව
01	පුද්ගල උපදේශන (සැසි)	35,159	27,724
02	වෘත්තීය පුහුණුව (ඒකල)	247	247
03	මත් නිවාරණ උපදේශන වැඩසටහන්	2,627	27,956
04	වෘත්තීය මාර්ගෝපදේශන	857	5,559
05	ප්‍රජා සෞඛ්‍ය වැඩසටහන් (වෛද්‍ය/ආයුර්වේද වෛද්‍ය)	425	5,494
06	ආකල්ප සංවර්ධන වැඩසටහන් පැවැත්වීම	1,606	16,912
07	පෞරුෂත්ව සංවර්ධන හා වෙනත්	1,168	12,023
08	රුක් රෝපණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම	543	4,304
09	පොදු ස්ථාන පවිත්‍රතා ශ්‍රමදාන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම	5,374	30,874
10	අධ්‍යාත්මික සංවර්ධන වැඩසටහන් පැවැත්වීම	1,554	13,871
11	සෞන්දර්යාත්මක වැඩසටහන් පැවැත්වීම	330	5,644
12	ක්‍රීඩා හා ශාරීරික සුවතා වැඩසටහන් පැවැත්වීම	189	3,264
13	පියවර 12 වැඩසටහන්	417	3,576
14	පවුල් හමු වැඩසටහන් පැවැත්වීම	731	4,051
15	පවුල් සුබසාධන වැඩසටහන් (ආහාර මළු/පාසල් උපකරණ/වැඩිහිටි හා ආබාධිත දීමනා වැනි සුබසාධන කටයුතු)	727	1,991
16	ගෘහය හා ගෘහ පරිසරය කළමනාකරණය,පවුලේ මූල්‍ය කළමනාකරණ වැඩසටහන්	1,953	6,992
17	ආඥාලාභී ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම	93	93
18	ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම ප්‍රජා මූල සංවිධාන දැනුවත් කිරීම (ග්‍රාම නිලධාරී කොට්ඨාස ආවරණය වන පරිදි)	2,056	61,876

19	රාජ්‍ය නිලධාරීන් හා වෘත්තිකයන් දැනුවත් කිරීමේ වැඩසටහන්	319	11,720
20	විශේෂ දින වැඩසටහන් (නිදහස් දින, පරිසර දින, වැඩිහිටි දින)	313	7,147

- **2025 වර්ෂයේදී මෙම දෙපාර්තමේන්තුවට වෙන් වූ මුදල් යොදවා ආඥාලාභීන් විශෝධනය සඳහා සිදු කරන ලද වැඩසටහන් පිළිබඳව තොරතුරු**

අනු අංකය	වැඩසටහන	වැය කරන ලද මුදල (රු.)
01	මත් නිවාරණ උපදේශන වැඩසටහන්	21,020.00
02	වෘත්තීය පුහුණුව	8,400.00
03	ප්‍රජා සෞඛ්‍ය වැඩසටහන් (වෛද්‍ය/ආයුර්වේද වෛද්‍ය)	11,500.00
04	අධ්‍යාත්මික සංවර්ධන වැඩසටහන් පැවැත්වීම	70,600.00
05	පවුල් හමු පැවැත්වීම	201,505.00
06	සෞන්දර්යාත්මක වැඩසටහන් පැවැත්වීම	229,950.00
07	ක්‍රීඩා වැඩසටහන් පැවැත්වීම	361,700.00
08	ආකල්ප සංවර්ධන වැඩසටහන් පැවැත්වීම	150,350.00
09	ආඥාලාභී පවුල්වල සාමාජිකයින්ගේ සුභසාධනය ඉහළ නැංවීම	35,825.00
10	ප්‍රජාව දැනුවත් කිරීමේ විශේෂ වැඩසටහන් පැවැත්වීම	83,650.00
11	රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීම (ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස ආවරණය වන පරිදි) හා අධිකරණ නිලධාරීන් හා නීතිඥවරු දැනුවත් කිරීම	77,090.00
12	රුක් රෝපණ	12,350.00
13	ශ්‍රමදාන	71,755.00
14	රස කැවිලි නිෂ්පාදනය හා අලෙවිය සම්බන්ධ අවුරුදු පොළ	24,486
15	විශේෂ දින	103,290.00

2.2 සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය (2025.01.01 දින සිට 2025.12.31දක්වා)

- **<u>සාර්ථක ලෙස විශෝධනය වූ පුද්ගලයින් සඳහා පුද්ගල/ පවුල් සංවර්ධන වැඩසටහන් යටතේ ස්වයං රැකියා ආධාර ව්‍යාපෘති සිදු කිරීම</u>**

ප්‍රජා පාදක විශෝධනය සඳහා යොමු කරනු ලබන පුද්ගලයින්ගෙන් වැඩි ප්‍රතිශතයක් මත්ද්‍රව්‍ය හෝ මද්‍යසාර සම්බන්ධ වරදකරුවන් වන අතර, එම පුද්ගලයින් ඉන් මුදවා යහපත් පුරවැසියන් ලෙස සමාජගත කිරීම සඳහා විශේෂ අවධානය යොමු කර එමඟින් මත්ද්‍රව්‍ය සඳහා අබ්බැහි වූ පුද්ගලයන් ඉතා සාර්ථකව විශෝධනය කර ඔවුන් සමාජීය හා ආර්ථික වශයෙන් නඟා සිටුවීම සඳහා කටයුතු කරනු ලබයි. මෙහිදී මොවුන්ගේ ආර්ථිකය ශක්තිමත් කිරීම සඳහා කටයුතු කරනු ලබන අතර, ඒ සඳහා එක් එක් පුද්ගලයාගේ හැකියාව, කැමැත්ත, වෙළඳපල අනුව, ඔවුන් ස්වයං රැකියා සඳහා යොමු කිරීම මෙමඟින් සිදු කරනු ලබයි. ඒ අනුව මත්ද්‍රව්‍ය සම්බන්ධයෙන් වරදකරුවෙකු වූ පුද්ගලයෙක් විධිමත් ලෙස උපදේශන ක්‍රියාවලිය හා මත් ප්‍රතිකාර සඳහා යොමු කර වෛද්‍ය උපදෙස් පරිදි නේවාසික/අනේවාසික හෝ සායනික ප්‍රතිකාර සඳහා යොමු කරනු ලබයි. මීට සමගාමීව මෙම පුද්ගලයන්ට තම පවුල තුළ ඉතා විශ්වාසනීය හා ආරක්ෂිත වට පිටාවක් නිර්මාණය කිරීම සඳහා පවුල් සංවර්ධන සැලැස්මක් ක්‍රියාත්මක කර යහපත් පුද්ගලයෙකු ලෙස සමාජගත කිරීමේ කටයුතු සිදු කරනු ලබයි. ප්‍රජා විශෝධන ක්‍රියාවලියෙන් පසුව ඉතා සාර්ථකව විශෝධනය වූ ස්ථිර ආදායම් මාර්ගයක් නොමැති මෙවැනි පුද්ගලයින්ට වෘත්තීය නිපුණතාවයක් ලබා ගැනීමට වෘත්තීය පුහුණු වැඩසටහන් සඳහා යොමු කරනු ලබයි.

ස්වයං රැකියා ආරම්භ කිරීමට කැමැත්ත හා හැකියාව ඇති පුද්ගලයින් ප්‍රාදේශීය ප්‍රජා විශෝධන කාර්යාල හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් විධිමත්ව අධ්‍යයනය කර සුදුසු පුද්ගලයින් හඳුනාගෙන ඔවුන් ඒ සඳහා යොමු කරනු ලබයි.

ස්වයං රැකියා ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට මූලික ප්‍රාග්ධනයක් හෝ සලසා ගැනීමට නොහැකි පුද්ගලයින් සඳහා, මෙම ව්‍යාපෘතිය යටතේ රු. 50,000.00ක උපරිමයකට යටත්ව ආධාර මුදලක් අදාළ ප්‍රාදේශීය ලේකම් මඟින් (උපකරණ හෝ අමු ද්‍රව්‍ය ලබා ගැනීම සඳහා) ලබා දීමට කටයුතු කරනු ලබයි. එමෙන්ම ආඥාලාභීන්ගේ ශ්‍රමය ඵලදායි ලෙස යෙදවීම සඳහා නිෂ්පාදන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අවධානය යොමු කර ඇත. 2025 වර්ෂයේ වෙන් කරන ලද මිලියන 06 ක ප්‍රතිපාදන ප්‍රමාණයෙන් නියෝගලාභීන් 93 දෙනෙකු සඳහා හඳුනාගත් ස්වයං රැකියා ව්‍යාපෘති 93ක් ක්‍රියාත්මක කිරීමට අදාළව රු. 4,297,323.00ක මුදලක් ගෙවීම් සිදු කර ඇත. මේ යටතේ කුකුළු පාලනය, එළු පාලනය, විසිතුරු මත්ස්‍ය වගාව, පැස්සුම් වැඩ, යතුරුපැදි අලුත්වැඩියාව, කෙටිකෑම නිෂ්පාදනය, බුලත් වගාව, මේසන් වැඩ, පෙදරේරු ශිල්පය, මල් වගාව, කම්හල්වැඩ, ජංගම වෙළෙඳ කුටි, බිම්මල් වගාව, වඩු කර්මාන්තය, ඉදල් නිෂ්පාදනය,ගඩොල් කැපීම,පින්තාරුකරණය, ගෙවතු වගාව,ධීවර හා කෘෂි භෝග වගාව වැනි ස්වයං රැකියා ව්‍යාපෘති ක්‍රියාත්මක කර ඇත.

- **<u>දුෂ්කරතා සහිත හඳුනාගත් පුද්ගලයින්ගේ පවුල් සුබසාධනය යටතේ දරුවන් සඳහා අධ්‍යාපන ආධාර ලබා දීම</u>**

අඟුලාභී පවුල්වල සාමාජිකයින්ගේ සුභසාධනය යටතේ දරුවන්ගේ අධ්‍යාපන ආධාර සහ මූලික අවශ්‍යතා සපුරාලීම සඳහා වැඩසටහන් 14ක් වෙනුවෙන් රු. 1,690,677.00ක ප්‍රමාණයක් ගෙවීම් සිදු කර ඇත.

2.3 එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය හා අපරාධ පිළිබඳ ආයතනය (UNODC) මගින් ප්‍රජා පාදක විශෝධනය පිළිබඳව ගරු විනිසුරුවරුන්ගේ දැනුවත්භාවය වර්ධනය කිරීම - බස්නාහිර පළාත

එක්සත් ජාතීන්ගේ මත්ද්‍රව්‍ය සහ අපරාධ පිළිබඳ ආයතනය (UNODC) මගින් බස්නාහිර පළාත් ගරු විනිසුරුවරුන් ප්‍රජා පාදක විශෝධනය පිළිබඳ දැනුවත්භාවය වර්ධනය කිරීම සඳහා වැඩසටහනේ දෙවන අදියර කොළඹදී පවත්වන ලදී. ඒ අනුව ගරු මහේස්ත්‍රාත්වරු 35ක් සහභාගී වූ අතර ඒ තුළින් ප්‍රජා පාදක විශෝධන ක්‍රියාවලිය වඩාත් ඵලදායී හා කාර්යක්ෂම අයුරින් සිදු කිරීමට කටයුතු කරන ලදී. මෙම වැඩසටහන් වල සාර්ථකත්වය මත එම ගරු විනිසුරුවරු සහභාගීවූ අධිකරණ වල ප්‍රජා පාදක විශෝධන නියෝග සංඛ්‍යාව වැඩිවීම, පූර්ව දණ්ඩන වාර්තා කැඳවීම, විවෘත අධිකරණයේදී වාර්තා කැඳවීම, විශෝධන නියෝගයන් පිළිබඳව අවධානය යොමු කිරීම, විශෝධන කොන්දේසි පිළිබඳ ගරු විනිසුරුවරුන්ගේ අවධානය යොමු වීම හා එම නියෝග අනුව කටයුතු කරන ලෙස ආඥාලාභීන් ගරු අධිකරණයේදී දැනුවත් කිරීම යන ක්‍රියාමාර්ග මගින් ප්‍රජා පාදක විශෝධන නියෝග ප්‍රමාණාත්මකව හා ගුණාත්මකව වර්ධනය වී ඇත.

තව දුරටත් ගරු විනිසුරුවරුන් දැනුවත් කිරීමේ වැඩසටහන් 03ක් සංවිධානය කර තිබුනද ඇමෙරිකා එක්සත් ජනපදය එක්සත් ජාතීන්ගේ ආයතන වෙත මුදල් ලබා දීම නතර කිරීම මත එම වැඩසටහන් පැවැත්වීම නතර විය. නමුත් 2024 වර්ෂයේදී ගරු අධිකරණ මගින් ලබා දුන් නියෝග සංඛ්‍යාව 15,631ක්වූ අතර 2025 වර්ෂයේදි එය 16,000ක් දක්වා වර්ධනය වෙතැයි අපේක්ෂා කළ නමුත් මෙම ගරු විනිසුරුවරුන් දැනුවත් කිරීම මත මෙම නියෝග සංඛ්‍යාව 19,203ක් දක්වා වර්ධනය විය. බස්නාහිර පළාත් නියෝග සංඛ්‍යාව 2024 වර්ෂයේදී 3,740ක්වූ අතර 2025 වර්ෂයේදී 6,066ක්වූ බැවින් බස්නාහිර පළාත් නියෝග සංඛ්‍යාව වර්ධනය වීම සමස්ථ නියෝග සංඛ්‍යාව වර්ධනය වීමට හේතුවක් වූ බව දෘශ්‍යමාන වේ.

මෙම ගරු විනිසුරුවරුන් දැනුවත් කිරීමේ දේශණ ගරු මහාධිකරණ විනිසුරු ලංකා ජයරත්න මහත්මිය හා මෙම දෙපාර්තමේන්තුවේ සහකාර කොමසාරිස් ආශා ජයවර්ධන මහත්මිය විසින් සිදු කරන ලදී.

සංවර්ධන ව්‍යාපෘතිවල ප්‍රගතිය (2025.01.01 දින සිට 2025.12.31 දක්වා)

ව්‍යාපෘතියේ නම	ප්‍රතිපාදන ප්‍රමාණය (රු.)	වැය කරන ලද කාරණය	වැය වූ මුදල (රු.)	මූල්‍ය ප්‍රගතිය (%)	භෞතික ප්‍රගතිය			
					ආඥාලාභීන් සංඛ්‍යාව (2025+පෙර වර්ෂ වලින් ඉදිරියට ගෙන ආ ශේෂය)	සාර්ථකව විශෝධනය කරන ලද සංඛ්‍යාව	මාස 06 පසු විපරම් ක්‍රියාවලිය සම්පූර්ණ කර සාර්ථකව විශෝධනය වූ	
							සංඛ්‍යාව	ප්‍රතිශතය
වැරදිකරුවන් වූ ප්‍රජා විශෝධන ආඥාලාභීන් විශෝධනය කිරීම	6,000,000.00	නියෝග ක්‍රියාත්මක කිරීම			27,610	12,083	1,109	23%
		සාර්ථකව විශෝධනය කරන ලද ආඥාලාභීන්ගේ ජීවනෝපාය සංවර්ධන සඳහා හඳුනාගන්නා ලද ස්වයං රැකියා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම,ඵලදායී ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම හා ආඥාලාභී පවුල්වල සාමාජිකයින්ගේ සුභසාධනය යටතේ දරුවන්ගේ අධ්‍යාපනය හා මූලික අවශ්‍යතා සපුරාලීම සඳහා අවශ්‍ය ආධාර ලබා දීම.	6,000,000.00	100%				

2.4 ඉලක්ක

01. සුළු වැරදි සම්බන්ධ වරදකරුවන් වන පුද්ගලයින් ප්‍රජා පාදක විශෝධනය සඳහා යොමු කර ගැනීම, වැඩි කර ගැනීම හා විශෝධන කටයුතුවල සාර්ථකත්වය වැඩි කිරීම

02. නිලධාරීන්ගේ ධාරිතා සංවර්ධනය
   - ❖ ජ්‍යෙෂ්ඨ ප්‍රජා විශෝධන නිලධාරි හා ප්‍රජා විශෝධන නිලධාරීන් සඳහා ප්‍රජා පාදක විශෝධන ක්‍රියාවලිය හා එහි ප්‍රවණතා පිළිබඳව දැනුවත් කිරීම
   - ❖ සංවර්ධන නිලධාරීන් සඳහා උපදේශනය, මත් නිවාරණය, සමාජ වැඩ මැදිහත්කරණය පිළිබඳ පුහුණු ලබාදීම තවදුරටත් සිදු කිරීම
   - ❖ සියලුම නිලධාරීන්ගේ පරිගණක සාක්ෂරතාවය වැඩි දියුණු කිරීම

03.ප්‍රතිකාර ක්‍රියාවලිය විධිමත් කිරීම
   - ❖ ශ්‍රී ලංකාවම ආවරණය වන පරිදි ප්‍රතිකාර මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම (සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ රෝහල් ආශ්‍රිතව)

04. සාර්ථකව විශෝධනය වන ආඥාලාභීන් සුළු පරිමාණ ව්‍යවසායකයන් බවට පත් කිරීම

05. ප්‍රජා පාදක විශෝධන ක්‍රියාවලිය මහජනතාවට සමීප කිරීම සඳහා ප්‍රචාරණ කටයුතු පුළුල් කිරීම

06. ප්‍රජා පාදක විශෝධන ක්‍රියාවලියේ තොරතුරු කළමනාකරණය කිරීම සඳහා කටයුතු කිරීම
   - ❖ දෙපාර්තමේන්තුව සඳහා වෙබ් අඩවියක් සකස් කර පවත්වාගෙන යෑම
   - ❖ ආඥාලාභී තොරතුරු කළමනාකරණ පද්ධතියක් නිර්මාණය කිරීම

07. ප්‍රජා පාදක විශෝධන පනත සඳහා අවශ්‍ය සංශෝධනයන් සිදු කරමින් ප්‍රජා විශෝධන ක්‍රියාවලිය තවදුරටත් පුළුල් කිරීම

08. ආඥාලාභීන්ගේ බහුතරය මත්පැන් සහ මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහි වූ පුද්ගලයන් බැවින් ප්‍රතිකාර ක්‍රමවේදයක් මඟින් පුද්ගලයන් විශෝධනයට ලක් කිරීම පිළිබඳව වැඩි අවධානයක් යොමු කිරීම.

09. සංවර්ධන නිලධාරීන් හරහා ප්‍රජා විශෝධන ආඥාලාභීන්ගේ පසු විපරම් ක්‍රියාවලිය වඩාත් විධිමත්ව තවදුරටත් සිදු කිරීම.

10. ආඥාලාභීන් සාර්ථකව විශෝධනය කිරීමෙන් අනතුරුව වරදින් මිදුණු යහපත් පුද්ගලයින් බවට පත් කිරීම හා ඔවුන්ගේ පවුල් ආර්ථික වශයෙන් සවිබල ගැන්වීම සඳහා ස්වයං රැකියා ව්‍යාපෘති තවදුරටත් ක්‍රියාත්මක කිරීම.

03 පරිච්ඡේදය - මූල්‍ය කාර්ය සාධනය

3.1 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය

ඒසීඒ-එෆ්

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය

සංශෝධිත සමවැය ප්‍රතිපාදන 2025		සටහන	තත්‍ය 2025	2024	
රු.			රු.	රු.	
	ආදායම් ලැබීම්				
-	ආදායම් බදු	1	-	-	
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	ඒසීඒ-1
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	මුළු ආදායම් ලැබීම් (අ)		-	-	
-	ආදායම් නොවන ලැබීම්		-	-	
-	භාණ්ඩාගාර අග්‍රිම		773,129,000	603,431,000	ඒසීඒ-3
-	තැන්පතු		382,615	1,325,966	ඒසීඒ-4
-	අත්තිකාරම් ගිණුම්		21,278,262	17,316,773	ඒසීඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ලැබීම්		-	-	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**794,789,877**	**622,073,740**	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)**		**794,789,877**	**622,073,740**	
	භාණ්ඩාගාරයට ප්‍රේෂණ (ඈ)		0.14	62.29	
	ශුද්ධ ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඉ = (ඇ)-(ඈ)		**794,789,877**	**622,073,677**	
	අඩු කළා : වියදම්				
-	**පුනරාවර්තන වියදම්**				
707,000,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	701,059,277	532,685,913	
92,800,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	88,025,252	86,686,689	ඒසීඒ-2(ii)
3,000,000	සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම්	7	2,325,425	2,519,403	
-	පොළී ගෙවීම්	8	-	-	
200,000	වෙනත් පුනරාවර්තන වියදම්	9	20,000	65,000	
803,000,000	**මුළු පුනරාවර්තන වියදම් (ඊ)**		**791,429,953**	**621,957,006**	
	මූලධන වියදම්				
7,500,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම	10	5,699,437	5,985,118	
7,500,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	7,461,706	26,450,469	
-	ප්‍රාග්ධන මාරුකිරීම්	12	-	-	ඒසීඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13	-	-	
3,000,000	හැකියා වර්ධනය	14	2,958,883	2,989,150	
6,000,000	වෙනත් මූලධන වියදම්	15	6,000,000	5,000,000	
24,000,000	**මුළු මූලධන වියදම් (උ)**		**22,120,026**	**40,424,738**	
	තැන්පතු ගෙවීම්		351,358	1,232,383	ඒසීඒ-4
	අත්තිකාරම් ගෙවීම්		51,778,711	27,694,630	ඒසීඒ-5
	වෙනත් ප්‍රධාන ලෙජර් ගිණුම් ගෙවීම්		-	-	
	ප්‍රධාන ලෙජර් වියදම් (ඌ)		**52,130,069**	**28,927,013**	
	මුළු වියදම් එ = (ඊ+උ+ඌ)		**865,680,049**	**691,308,757**	
827,000,000	**දෙසැම්බර් 31 දිනට ශේෂය ඒ = (ඉ-එ)**		**(70,890,172)**	**(69,235,079)**	
	අග්‍රිම ගැලපුම් ප්‍රකාශනය අනුව ශේෂය		(70,890,172)	(69,235,079)	ඒසීඒ-7
	දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය		-		ඒසීඒ-3
		1	**(70,890,172)**	**(69,235,079)**	

3.2 මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

ඒසීඒ-8

2025 දෙසැම්බර් 31 දිනට

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය

	සටහන	තථ්‍ය 2025 රු.	2024 රු.
<u>මූල්‍ය නොවන වත්කම්</u>			
දේපළ, පිරියත හා උපකරණ	ඒසීඒ-6	109,891,912	83,032,894
<u>මූල්‍ය වත්කම්</u>			
අත්තිකාරම් ගිණුම්	ඒසීඒ-5/5(ඒ)	84,622,058	54,121,610
මුදල් හා මුදල් සමාන දෑ	ඒසීඒ-3	-	-
මුළු වත්කම්		**194,513,970**	**137,154,504**
<u>ශුද්ධ වත්කම් / ස්කන්ධය</u>			
භාණ්ඩාගාරය වෙත ශුද්ධ වත්කම්		84,438,467	53,969,275
දේපළ පිරියත හා උපකරණ සංචිතය		109,891,912	83,032,894
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	**ඒසීඒ-5(බී)**		
<u>ජංගම වගකීම්</u>			
තැන්පතු ගිණුම්	ඒසීඒ-4	183,590	152,333
අග්‍රිම ශේෂය	ඒසීඒ-3	-	-
මුළු වගකීම්		**194,513,970**	**137,154,503**

පිටු අංක 01 සිට 21 දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 7 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ ඇමුණුම් පිටු අංක 22 සිට 26 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. **මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025.12.17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 විධිවිධානයන්ට අනුකූලව** සිදුකර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම් කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

2018 අංක 19 දරන විගණන පනතේ 38 (1) (ඇ) වගන්තිය අනුව මූල්‍ය පාලනය සඳහා ඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් වාර්තාකරණ ආයතනය තුළ පවතින බවත් මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කිරීමටත් ඒ අනුව එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය පරිදි වෙනස් කිරීම් සිදුකිරීමට වරින් වර සමාලෝචන සිදුකරන බවත් මෙයින් සහතික කරමු.

....	....	....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි	ගණන්දීමේ නිලධාරි	ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරී/ අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
නම :	නම :	නම :
තනතුර :	තනතුර :	
දිනය : 25/02/2026	දිනය : 2026/02/23	දිනය : 2026/02/23

ජනාධිපති නීතිඥ අයේෂා ජිනසේන
ලේකම්
අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය
අංක: 19, ශ්‍රී සංඝරාජ මාවත,
කොළඹ 10.

දිලාන් ගුණරත්න
කොමසාරිස්
ජන පාදක විශෝධන දෙපාර්තමේන්තුව

ආර්.කල්පනී තරංගා
ගණකාධිකාරී
ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව

2

3.3 2025.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

ඒසීඒ-සී

2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

	සටහන 2025 රු.	සංශෝධිත 2024 රු.
<u>මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	-	-
වෙනත් ආදායම් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	48,524,042	25,146,595
අග්‍රිම ලැබීම්	773,129,000	603,431,000
අත්තිකාරම් අයකර ගැනීම්	18,761,465	14,037,703
තැන්පතු ලැබීම්	382,615	1,325,966
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**840,797,122**	**643,941,265**
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	768,126,860	597,803,502
සහනාධාර සහ මාරුකිරීම්	*2,325,425*	*2,519,403*
මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම, මූලධන මාරුකිරීම්, හැකියා වර්ධනය හා වෙනත් මූලධන වියදම්	10,986,342	11,100,017
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	2,736,953	126,143
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	0.14	62.29
අත්තිකාරම් ගෙවීම්	48,832,888	24,703,758
තැන්පතු ගෙවීම්	351,358	1,232,383
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**833,359,826**	**637,485,268**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)=(අ)-(ආ)	**7,437,296**	**6,455,996**
<u>ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
පොළී	-	-
ලාභාංශ	-	-
හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	24,410	25,905
උපණය අයකර ගැනීම්	-	-
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ)	**24,410**	**25,905**
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>		
මූලධන වත්කම් ඉදිකිරීම්, මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්පත් කර ගැනීම්	7,461,706	6,481,901
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ)	**7,461,706**	**6,481,901**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ)=(ඈ)-(ඉ)	**(7,437,296)**	**(6,455,996)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=(ඇ) + (ඊ)	(0)	0
<u>මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්</u>		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	-	-
<u>අඩුකළා : මුදල් වැය කිරීම්</u>		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	-	-
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ)	-	-
මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ)+(ඒ)	(0)	-
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	(0)	-

3

3.4 මූල්‍ය සටහන් ප්‍රකාශය

වාර්තාකිරීමේ පදනම

1) **පිළියෙල කිරීමේ අරමුණ**

මූල්‍ය ප්‍රකාශන, රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025.12.17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 විධිවිධානයන්ට අනුකූලව පිළියෙල කර ඇත.

2) **වාර්තාකරණ කාලපරිච්ඡේදය**

2025 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

3) **මිනුම්කරණ පදනම**

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර සමහර වත්කම් නැවත තක්සේරු කරන ලද වටිනාකමට ඉදිරිපත් කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි.

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල්වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

4) **ආදායම් හඳුනාගැනීම**

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාලසීමාව නොසලකා, මුදල් ලැබෙන කාලපරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

5) **දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම**

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනාගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදාගනී.

2024 වර්ෂයේදී UNODC ආයතනයෙන් ප්‍රදානයක් වශයෙන් ලද පරිගණක යන්ත්‍ර 50 වෙනුවෙන් වූ රු. 19,968,568.50ක වටිනාකම 2025 වර්ෂයේදී ගිණුම් ගත කරන ලදී.

6) **දේපළ, පිරියත හා උපකරණ සංචිතය**

මෙම සංචිත ගිණුම දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම වේ.

7) **මුදල් හා මුදල් සමාන දෑ**

2025 දෙසැම්බර් 31 දිනට මුදල් හා මුදල් සමාන දෑ අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් සමන්විත වේ.

* යම් වාර්තාකරණ ආයතනයකට විශේෂිත වූ ගනුදෙනු ඇති අවස්ථාවල දී එම ආකෘතිවල අවශ්‍ය පරිදි සංශෝධනයන් සිදුකර ගත හැක. එසේම "වාර්තාකිරීමේ පදනම" යටතේ එම විශේෂිත ගනුදෙනු සඳහා අවශ්‍ය හෙළිදරව් කිරීම ඇතුළත් කළ හැක.

* තම වාර්තාකරණ ආයතනයට අදාළ ගිණුම්කරණ ප්‍රතිපත්ති පමණක් වාර්තාකිරීමේ පදනම යටතේ හෙළිදරව් කළ යුතු ය.

5

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

					රු. 000
ආදායම් සංකේතය	ආදායම් විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මූලික ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
අදාළ නැත					

3.6 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම (රු.)	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන අවසන් කරන ලද අවසන් ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුල් ප්‍රතිපාදනය (රු.)	අවසාන ප්‍රතිපාදනය (රු.)		
පුනරාවර්තන	743,000,000	803,000,000	791,429,953	98.55%
ප්‍රාග්ධන	24,000,000	24,000,000	22,120,026	92.16%

3.7 මු.රෙ. **208** ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ /දෙපාර්තමේන්තු වල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය / දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදන		තත්‍ය වියදම (රු.)	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන අවසන් කරන ලද අවසන් ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
		මුල් ප්‍රතිපාදන (රු.)	අවසාන ප්‍රතිපාදනය (රු.)		
1	මැතිවරණ කොමිසම	2,736,953	2,736,953	2,736,953	100%

3.8 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

වත්කම් කේතය	වත්කම් කේත විස්තරය	**2025.12.31** දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය(රු.)	**2025.12.31** දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය(රු.)	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස
9157	යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ	109,891,912	109,891,912	-	100%

3.9 විගණකාධිපතිගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. JLO/F/DCBC/FS/04/2025	ඔබේ අංකය / உமது இல. / Your No.	දිනය / திகதி / Date 2026 මැයි 20 දින

ප්‍රජා පාදක විශෝධන කොමසාරිස්
ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව

ශීර්ෂය 326 - ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 326 - ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ (සංශෝධිත පරිදි) 11(1) වගන්තිය ප්‍රකාරව ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත්කළ යුතු විගණකාධිපති වාර්තාව යථාකාලයේ දී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුවේ 2025 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනවලින්, මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහ, මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1හි සඳහන් මූල්‍ය ප්‍රකාශන සකස්කිරීමේ පදනමට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තරකර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කරුණක් අවධාරණය කිරීම - මූල්‍ය ප්‍රකාශන සකස්කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශන සකස්කිරීමේ පදනම විස්තර කරන මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් 1 කෙරෙහි අවධානය යොමුකරවමි. මූල්‍ය ප්‍රකාශන රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025 අනුව ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුවේ, මහා භාණ්ඩාගාරයේ සහ පාර්ලිමේන්තුවේ අවශ්‍යතාවය සඳහා සකස්කර ඇත. එමනිසා, මෙම මූල්‍ය ප්‍රකාශන වෙනත් අරමුණු සඳහා සුදුසු නොවිය හැක. මගේ වාර්තාව ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරයේ සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ භාවිතය සඳහා පමණක් අරමුණුකර ඇත. මෙම කරුණ සම්බන්ධයෙන් මගේ මතය විකරණය කරනු නොලැබේ.

1.4 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

රජයේ මුදල් රෙගුලාසි 150 හා 151 සහ 2025 දෙසැම්බර් 17 දිනැති රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක 02/2025ට අනුකූලව සියලුම ප්‍රමාණාත්මකතාවයන් සම්බන්ධයෙන් සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසිපරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතු ය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උපවගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර පවත්වාගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු අතර, එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදුකර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු ය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත්කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදුකිරීමේ දී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණයකර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම්කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේ දී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයාගැනීමේ දී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව	ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය	මෙම වාර්තාවේ ඡේද යොමුව
1.6.2.(ආ)	මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය විසින් නිකුත්කරන ලද 2017 ජුනි 28 දිනැති අංක 01/2017 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 ඡේදයට අනුව එක් එක් ආයතනය විසින් මිලදීගන්නා සහ අපහරණය කරන වත්කම් සම්බන්ධයෙන් තොරතුරු අදාළ කාර්තුව අවසානයේ දී කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට ඉදිරිපත්කළ යුතු වුවත්, ආකෘතිපත්‍ර ඒසීඒ - 6 අනුව සමාලෝචිත වර්ෂයේ දී මූල්‍ය නොවන වත්කම් යටතේ යන්ත්‍ර හා උපකරණ ආරම්භක ශේෂයට රු.17,563,795ක වත්කම් එකතුකර තිබූ අතර, ඉන් රු.9,706,405ක වටිනාකමට අදාළ වත්කම් පිළිබඳ තොරතුරු පමණක් කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වර්ෂය තුළ දී ඉදිරිපත්කර තිබුණි.	1.6.1(ඇ)

3. මූල්‍ය සමාලෝචනය

3.1 වියදම් කළමනාකරණය

(අ) අවශ්‍යතාවය නිසිපරිදි හඳුනාගෙන පූර්ව සැලසුම් සකස්කර ප්‍රතිපාදන වෙන්කර නොගැනීම සහ මනා කළමනාකරණයකින් යුක්තව ප්‍රතිපාදන වැයනොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළ වැය විෂයන් 12ක් සඳහා වෙන්කරන ලද රු.27,700,000ක ප්‍රතිපාදනවලින් රු.7,105,164ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. වැය විෂයන්හි එසේ ඉතිරිවීම් ප්‍රතිශතය සියයට 10 සිට සියයට 100ක අතර පරාසයක පැවතුණි.

(ආ) මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව මුදල් වර්ෂය තුළ තම දෙපාර්තමේන්තුවට ඉටුකළ හැකි ශක්තිය ඇතුළත, සහේතුකව පූර්වාණුමාන කළ හැකි සියලුම සේවාවන් ඇස්තමේන්තුවල ඇතුළත්කර, ඇස්තමේන්තු හැකිතාක් දුරට නිවැරදිව පිළියෙල නොකිරීම හේතුවෙන් දෙපාර්තමේන්තුවේ මුළු ශුද්ධ ප්‍රතිපාදනය හා ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය අතර වෙනස ඇස්තමේන්තුගත ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස සියයට (20) සිට සියයට 83 අතර පරාසයක පැවතුණි.

3.2 බැරකම් හා බැදීම්වලට එළැඹීම

(අ) සමාලෝචිත වර්ෂයේ බැදීම් හා බැරකම් ප්‍රකාශනයේ, ආයතනයේ බැරකම් ලේඛනයෙහි සහ භාණ්ඩාගාර මුද්‍රිත සටහන් (SA 92) තුළ ඇතුළත් නොවූ රු.1,678,531ක් වූ බැරකම් 2026 වර්ෂයේ දී නිරවුල්කර තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයන්හි ඇතුළත් බැරකම් පිළිබඳ ප්‍රකාශනය-(ඇමුණුම iv) තුළ බැරකම් ලෙස රු.132,696ක් සඳහන්කර තිබුණ ද, ආයතනයේ බැරකම් ලේඛනයෙහි එම අගය රු.442,419ක් විය. ඒ අනුව බැරකම් පිළිබඳ ප්‍රකාශනය-(i) (ඇමුණුම iv) තුළ රු.309,723ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) මුදල් අමාත්‍යාංශය විසින් නිකුත්කරන ලද 2017 අප්‍රේල් 27 දිනැති අංක 255/2017 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛයේ 02(අ) ඡේදයට අනුව පුද්ගල පඩිනඩි හා දීමනා හැර අනෙකුත් ගෙවීම් සඳහා වාර්ෂික අයවැය සීමාව තුළ ප්‍රථමයෙන් බැඳීම් හඳුනාගත යුතු වුව ද, දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේ දී වැය විෂයන් 05ක් සඳහා එළැඹිය හැකි උපරිම බැඳීම් සීමාව රු.95,908ක් වුව ද, ඊට පටහැනිව 2026 වර්ෂයේ දී මෙම වැය විෂයන් 05 සඳහා රු.1,522,190ක බැරකම් නිරවුල්කර තිබුණි.

3.3 ගණන්දීමේ නිලධාරි විසින් සිදුකළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරි විසින් පහත සඳහන් කරුණ සම්බන්ධයෙන් සහතිකවීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතුකර නොතිබුණි.

අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසිපරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායි ක්‍රමවේදයක් ඇති බවට ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු වුවත්, වාර්තාවේ 5.2 ඡේදයේ සඳහන් නිරීක්ෂණය අනුව එම අවශ්‍යතාවය ඉටුකර නොතිබුණි.

3.4 නීතිරීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

	නීතිරීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
(අ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ 110(1)	හානි හා පාඩු ලේඛනයක් පවත්වාගෙන ගිය ද, එය යාවත්කාලීන කර නොතිබුණි.
(ආ)	2024 පෙබරවාරි 06 දිනැති අංක PFD Circular No 08/2019(ii) දරන මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශ චක්‍රලේඛයේ 2 ඡේදය	දෙපාර්තමේන්තුව විසින් ප්‍රසම්පාදන කටයුතු කිරීමේ දී e-GP System වෙත ලියාපදිංචි විය යුතු වුවද, ඒ අනුව කටයුතු කර නොතිබුණි.
(ඇ)	2018 දෙසැම්බර් 31 දිනැති අංක 04/2018 දරන වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ මූල්‍ය නොවන වත්කම් තක්සේරු කිරීම් මාර්ගෝපදේශයෙහි 2.3, 3.3.1 සහ 4.3 ඡේද	සෑම වර්ෂ 05කට වරක්ම ඉඩම් හා ගොඩනැගිලි, කාර්යාල උපකරණ හා ගෘහභාණ්ඩ සහ පිරියත හා යන්ත්‍රෝපකරණ සඳහා නැවත තක්සේරුවක් සිදුකළ යුතු වුව ද, ඒ අනුව කටයුතුකර නොතිබුණි.
(ඈ)	2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙහි 9 වන ඡේදයේ සංශෝධිත මුදල් රෙගුලාසි 880	රජයේ නිලධාරීන් ඇපතැබීම පිළිබඳව රාජ්‍ය මුදල් ආදියේ භාරකාරීත්වය හා ආරක්ෂාව සම්බන්ධයෙන් වූ වගකීම ගණන්දීමේ නිලධාරියා සතුව පවතින බැවින්, නියමිත නිලධාරීන් විසින් ඇප තබන බවට වගබලා ගැනීම කළ යුතු යැයි සඳහන්කර තිබුණ ද, මුදල් රෙගුලාසි 315හි ඇප තැන්පත් කළ යුතු ගණකාධිකාරී, මුදල් අයකැමි හා ගබඩා භාරකරු වැනි තනතුරු දරන නිලධාරීන් අදාළ ඇපමුදල් තැන්පත්කර නොතිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්ය සාධනය

4.1.1 දැක්ම හා මෙහෙවර

දෙපාර්තමේන්තුවට අදාළ මෙහෙවර ලෙස, පසුවිපරමක් සහිත ඵලදායී ප්‍රජා විශෝධන ක්‍රියාවලියක් තුළින් සුළු වරදකරුවන් හා ඔවුන්ගේ පවුල් සාමාජීය, ආර්ථික, ආධ්‍යාත්මික හා මානසික වශයෙන් සංවර්ධනය කිරීම අරමුණ වන අතර, ඒ සඳහා තිරසාර සංවර්ධන අරමුණු යටතට මෙම ඉලක්කය ඇතුළත්කර තිබුණ ද, අරමුණු ළඟාකර ගැනීමේ ජයග්‍රහණ දර්ශක හඳුනාගෙන නොතිබුණි.

4.1.2 කාර්යභාරයන් ඉටුනොකිරීම

ප්‍රජා විශෝධන නියෝගයන්ට අදාළ කොන්දේසි සම්පූර්ණ කිරීම යටතේ ආඥාලාභීන්ගේ ශ්‍රමය රටේ සංවර්ධන කාර්යයන්ට දායක කරවීම සඳහා ආදායම් උත්පාදන ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය තුළ දී එය ක්‍රියාවට නංවා නොතිබුණි.

4.1.3 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබානොගැනීම

(අ) සමාලෝචිත වර්ෂය තුළ දී ප්‍රජා විශෝධන නියෝග ක්‍රියාත්මක කරන ආඥාලාභීන් 17,400ක් අතරින් ප්‍රජා විශෝධන නියෝග කඩකරන ආඥාලාභීන් 3,480ක් එනම් සියයට 20කට වඩා අඩුවෙන් පවත්වාගෙන යාමට සැලසුම්කළ ද, නියෝග කඩකළ ආඥාලාභීන් ගණන 4,754ක් එනම් සියයට 27ක මට්ටමක පැවතුණි.

(ආ) ආඥාලාභීන් සඳහා වැඩසටහන් පැවැත්වීම යටතේ සමාලෝචිත වර්ෂය තුළ දී ආඥාලාභීන් 500කට පමණ වෘත්තීය පුහුණුව (ඒකල) ලබාදීමට සැලසුම්කර තිබුණ ද, 247ක් පමණක් සහභාගී වී තිබූ අතර, එය සියයට 49ක් වැනි අවම මට්ටමක පැවතුණි.

4.1.4 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්

අනුරාධපුර, කැකිරාව ප්‍රදේශයේ විශෝධන මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම සඳහා 2024 වර්ෂයේ දී ඉඩමක් පවරාගෙන තිබුණ ද, සමාලෝචිත වර්ෂයේ දී එහි ඉදිකිරීම් කටයුතු ආරම්භකර නොතිබුණි.

4.1.5 මුදල් නිදහස්කර තිබුණත් ප්‍රගතියක් ලබානොතිබුණු ව්‍යාපෘති

පුත්තලම අධිකරණයේ ප්‍රජා විශෝධන කාර්යාලය සඳහා ඉදිකරනු ලබන ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු සඳහා දෙපාර්තමේන්තුව 2010 වර්ෂයේ ප්‍රතිපාදන යටතේ අධිකරණ අමාත්‍යාංශය විසින් රු.1,009,934ක මුදල් වියදම්කර තිබුණ ද, ඉදිකිරීම් කටයුතු අවසන්කර නොතිබුණි.

4.2 කළමනාකරණ දුර්වලතා

(අ) ප්‍රජා විශෝධන නිලධාරියෙකු 2019 ඔක්තෝබර් 01 සිට 2023 අගෝස්තු 14 දින දක්වා විදේශ රැකියාවක් සඳහා නිවාඩු ලබා තිබූ අතර, මෙම නිලධාරියාගේ නිවාඩු කාලය අවසන් වී තිබුණ ද, 2023 අගෝස්තු 15 දින සේවයට වාර්තාකර නොතිබුණි. මෙම නිලධාරියාට එදින සිට සේවය අතහැර යාමේ නිවේදනය 2024 ජූනි 04 දින නිකුත්කර තිබුණ ද, ගිවිසුම් ප්‍රකාරව ඔහුගෙන් අයකරගත යුතු වූ රු.1,106,560ක දණ්ඩන මුදල අයකර ගැනීමට මේ දක්වා

කටයුතුකර නොතිබුණි.

(ආ) පුත්තලම අධිකරණයේ ප්‍රජා විශෝධන කාර්යාලය 2022 ජුනි මාසයේ හදිසියේ ඇති වූ ගින්නකින් විනාශ වූ අතර, එම කාර්යාලයේ තිබූ රු.163,302ක් වටිනා පරිගණක යන්ත්‍රය හා එහි සියලු කොටස්, ඡායා පිටපත් යන්ත්‍රය, ඇඟිලි සළකුණු යන්ත්‍රය හා අනෙකුත් කාර්යාල උපකරණ සම්පූර්ණයෙන් විනාශ වී ගොස් තිබුණ ද, දෙපාර්තමේන්තුව විසින් සමාලෝචිත වර්ෂයේ දී ද, ඒ සම්බන්ධයෙන් විමර්ශන කටයුතු ආරම්භකර නොතිබුණි.

(ඇ) ප්‍රජා පාදක විශෝධන දෙපාර්තමේන්තුව මඟින් ඉටුකරනු ලබන කාර්යයන් වඩාත් කාර්යක්ෂමව ඉටුකිරීම සඳහා අවශ්‍ය අධීක්ෂණයක් සහ පසුවිපරමක් සඳහා උපදේශක මණ්ඩලයක් පත්කරන ලෙස රජයේ ගිණුම් කාරක සභාව විසින් 2023 ජුනි 09 දින නියෝගකර තිබුණි. ඒ අනුව 2024 වර්ෂයේ උපදේශක මණ්ඩලයක් පත්කර තිබූ අතර, මෙම මණ්ඩලය මාස 03කට වරක් රැස්විය යුතු වුවත්, සමාලෝචිත වර්ෂය තුළ දී මෙම මණ්ඩලය විසින් රැස්වීම් කිසිවක් පවත්වා නොතිබුණි. එමෙන්ම මේ වන විට මණ්ඩලය අක්‍රීයව පවතින හෙයින් මණ්ඩලය පිහිටුවීමේ ප්‍රධාන අරමුණ වූ වඩාත් සාර්ථක ප්‍රජා පාදක විශෝධන පද්ධතියක් සඳහා උපදෙස් ලබාදීම ඉටුවී නොතිබුණි.

(ඇ) උපදේශක මණ්ඩලයෙහි නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රජා පාදක විශෝධන කොමසාරිස්ගේ සභාපතීත්වයෙන් යුතු දෙපාර්තමේන්තු නිලධාරීන් 06දෙනෙකුගෙන් සමන්විත මෙහෙයුම් කමිටුවක් පත්කර තිබුණ ද, සමාලෝචිත වර්ෂය තුළ මෙම කමිටුව තෙවරක් පමණක් රැස්වී තිබූ අතර, මෙම කමිටුව ද අක්‍රියවී තිබුණි.

5. යහපාලනය

5.1 මහජනයා වෙත සේවා ඉටුකිරීම

දෙපාර්තමේන්තුව පිළිබඳව තොරතුරු බාහිර පාර්ශවයන්ට ලබාගැනීමට වෙබ් අඩවියක් නිර්මාණයකර තිබුණ ද, එය යාවත්කාලීනකර නොතිබීම හේතුවෙන් මහජනයා සඳහා අවශ්‍ය සේවාව ලබා දීමට නොහැකි වී තිබුණි.

5.2 අභ්‍යන්තර විගණනය

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40(i) වගන්තිය අනුව අමාත්‍යාංශය යටතේ ඇති එක් එක් දෙපාර්තමේන්තුව සඳහා එහි ගණන්දීමේ නිලධරයා විසින් එම දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන කටයුතු සිදුකිරීම පිණිස සුදුසු විගණකවරයෙකු පත්කරනු ලැබිය යුතු වුව ද, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

කේ. කේ. එස් ජයකොඩි
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.

04 පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශකය

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශකය (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

කාර්ය සාධන දර්ශකය	ප්‍රගතිය	
	සංඛ්‍යාව	ප්‍රතිශතය
ලබාගත් ප්‍රජා විශෝධන ආඥාලාභීන් සංඛ්‍යාව	27,610	100%
සාර්ථකව විශෝධනය කරන ලද සංඛ්‍යාව	12,083	72%
මාස 06ක පසුවිපරම් කාලය සම්පූර්ණ කර සාර්ථකව විශෝධනය වූ සංඛාව	1,109	23%
පවත්වනු ලැබූ විශෝධන වැඩසටහන් සංඛ්‍යාව	16,790	100%
පවත්වනු ලැබූ දැනුවත් කිරීමේ වැඩසටහන් සංඛ්‍යාව	2,688	100%
පවත්වනු ලැබූ පුහුණු වැඩසටහන් සංඛ්‍යාව (නිලධාරීන් සඳහා)	40	83%
ක්‍රියාත්මක කරන ලද ජීවනෝපාය සංවර්ධන ව්‍යාපෘති ගණන (සාර්ථකව විශෝධනය කරන ලද පුද්ගලයින්ගේ ජීවන තත්වය උසස් කිරීම)	93	100 %

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමවුම		
	100% -90%	75% - 89%	50% -74%
සමස්ත කාර්ය සාධන දර්ශකය	93%		

05 පරිච්ඡේදය - තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනා ගන්නා ලද තිරසාර සංවර්ධන අරමුණු ඉලක්කය-ජාතික සහ ජාත්‍යන්තර මට්ටමින් නීතියේ ආධිපත්‍යය ප්‍රවර්ධනය කිරීම සහ සැමට යුක්තිය සඳහා සමාන ප්‍රවේශය සහතික කිරීම

ඉලක්කය / අරමුණ	ඉලක්ක	ජයග්‍රහණදර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0%-49%	50%-74%	75%-100%
සුළු වැරදි සඳහා වරදකරුවන් වන පුද්ගලයින්ට අධිකරණයට ඉදිරිපත්වී නීතියට ප්‍රවේශවීමේ සම අයිතිය තහවුරු කිරීම හා එම වැරදිවලින් මිදී යහපත් පුරවැසියන් ලෙස ජීවත්වීම සඳහා ඉඩ ප්‍රස්ථා සැලසීම.	සුළු වැරදි සඳහා වැරදිකරුවන් වී ප්‍රජා පාදක විශෝධනය සඳහා යොමු කරනු ලබන පුද්ගලයින් ප්‍රජා විශෝධන ක්‍රියාවලිය තුළින් යහපත් පුද්ගලයින් බවට පත් කිරීම	සුළු වැරදි සඳහා වැරදිකරුවන් වී ප්‍රජා පාදක විශෝධනය සඳහා යොමු කරනු ලබන පුද්ගලයින්ගෙන් 40% ක ප්‍රමාණයක් ප්‍රජා විශෝධන ක්‍රියාවලිය තුළින් යහපත් පුද්ගලයින් බවට පත් කිරීම		72%	
	ප්‍රජා පාදක විශෝධනය සඳහා යොමු කරන ලද පුද්ගලයින් අතරින් මත්ද්‍රව්‍ය සම්බන්ධ වරදකරුවන් සඳහා මත් ප්‍රතිකාර කිරීම	මත්ද්‍රව්‍ය සම්බන්ධ වරදකරුවන් සඳහා මත් ප්‍රතිකාර කිරීම තුළින් ඉන් 20-30% ක ප්‍රමාණයක් ඉන් මුදවා ගැනීම			100%
	ප්‍රජා පාදක විශෝධනය සඳහා යොමු කරන ලද පුද්ගලයින්ගේ සමාජ යහපැවැත්ම තහවුරු කිරීම සඳහා සාමාජීය,ආර්ථික හා අධ්‍යාත්මික වශයෙන් නඟා සිටුවීම				

06 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු
ජ්‍යෙෂ්ඨ	6	3	3
තෘතියික	137	113	24
ද්විතියික	662	626	36
ප්‍රාථමික	12	9	3

6.2 කාර්ය මණ්ඩල තොරතුරු (2025.01.01 -2025.12.31)

අ.අ.	තනතුර	අදාල සේවාව	අනුමත සේවක සංඛ්‍යාව	දැනට සිටින සේවක සංඛ්‍යාව	පුරප්පාඩු සංඛ්‍යාව
1	ප්‍රජා පාදක විශෝධන කොමසාරිස්	ශ්‍රී ලං.ප.සේ. I	01	01	-
2	සහකාර කොමසාරිස් / නියෝජ්‍ය කොමසාරිස්	ශ්‍රී ලං.ප.සේ.II හෝ III	01	-	01
2	සහකාර කොමසාරිස් / නියෝජ්‍ය කොමසාරිස්	දෙපාර්තමේන්තුගත	02	01	01
3	ගණකාධිකාරී	ශ්‍රී ලං.ග.සේ.II හෝ III	01	01	-
4	අභ්‍යන්තර විගණක	ශ්‍රී ලං.ග.සේ.II හෝ III	01	-	01
5	ජ්‍යෙෂ්ඨ ප්‍රජා විශෝධන නිලධාරී	දෙපාර්තමේන්තුගත	10	8	2
6	භාෂා පරිවර්තක (දෙමළ)	භාෂා පරිවර්ථක සේවය	01	-	01
7	පරිපාලන නිලධාරී	කළමනාකරණ සේවා නිලධාරී සේවයේ අධි ශ්‍රේණිය	1	0	01
8	ප්‍රජා විශෝධන නිලධාරී	දෙපාර්තමේන්තුගත	125	105	20
9	සංවර්ධන නිලධාරී	සංවර්ධන නිලධාරී සේවය	515	503	12
10	තොරතුරු සන්නිවේදන සහකාර	තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සේවය	2	1	1
11	කළමනාකරණ සේවා නිලධාරී	කළමනාකරණ සේවා නිලධාරී සේවය	20	9	6
	ලිපිකරු	දෙපාර්තමේන්තුගත		05	-
12	වැඩපරීක්ෂක	දෙපාර්තමේන්තුගත	125	108	17
13	කාර්යාල කාර්ය සහායක	කාර්යාල සේවක සේවය	08	05	03
14	රියදුරු	ඒකාබද්ධ රියදුරු සේවය	04	04	0
එකතුව			**817**	**751**	**66**

*ත්‍රස්තවාදී ප්‍රහාරයකින් මිය ගිය සේවකයෙකුට වැටුප් ගෙවනු ලැබේ

6.3 ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය බලපාන ආකාරය

මේ වනවිට දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය ඉහල නැංවීම උදෙසා අත්‍යවශ්‍යම තනතුරු සඳහා පුරප්පාඩු පවතී. උදාහරණ ලෙස,

- සහකාර කොමසාරිස් (ශ්‍රී ලං.ප.සේ III/II) – 01
- සහකාර කොමසාරිස් - (දෙපාර්තමේන්තුගත) 01
- අභ්‍යන්තර විගනක - 01
- ජ්‍යෙෂ්ඨ ප්‍රජා විශෝධන නිලධාරී - 02
- භාෂා පරිවර්තක - 01
- පරිපාලන නිලධාරී - 01
- ප්‍රජා විශෝධන නිලධාරී - 20
- සංවර්ධන නිලධාරී - 12
- තොරතුරු සන්නිවේදන සහකාර - 01
- කළමනාකරණ සේවා නිලධාරී - 06
- වැඩ පරීක්ෂක - 17
- කාර්යාල කාර්යය සහායක - 03, ලෙස දැක්විය හැකිය.

මේ තත්වය යටතේ දෙපාර්තමේන්තුවේ රාජකාරි කටයුතු විධිමත්ව හා කාර්යක්ෂමව ඉටු කිරීමේ බාධා ඇත. විධායක මට්ටමේ තනතුරු පුරප්පාඩු වීම මත ආයතනයේ දැනට සේවයේ නියුතු 751 දෙනෙකුගේ පරිපාලන හා ආයතන කටයුතු නිසියාකාරව පවත්වාගෙන යාමටත් පුරප්පාඩු සම්පූර්ණ කිරීමේ කටයුතු කාර්යක්ෂමව සිදු කිරීමටත් බාධා සිදු වේ. එමෙන්ම ප්‍රජා විශෝධන නිලධාරී හා වැඩ පරීක්ෂක පුරප්පාඩු වීම හේතුවෙන් ප්‍රාදේශීය ප්‍රජා විශෝධන කාර්යාල නිසි පරිදි ක්‍රියාත්මක නොවීම මත ආයතනයේ ප්‍රධාන කාර්ය භාරය වන ආඥාලාභීන් විශෝධනය කිරීමේ කටයුතු සඳහා බාධා සිදු වේ. ප්‍රමාණවත් පරිදි අධීක්ෂණ මට්ටමේ නිලධාරී නොමැතිකම දෙපාර්තමේන්තුවේ දැක්ම සඳහා ළඟා වීමට බාධාවක් වේ.

ආයතනයක පවතින මානව සම්පත කාර්යක්ෂමව හා ඵලදායි ලෙස සේවයේ යෙදවීම සඳහා ධාරිතාවය සංවර්ධනය කළ යුතුය. ඒ අනුව දැනුම, ආකල්ප, කුසලතා සංවර්ධනය කිරීම කෙරෙහි අවධානය යොමු කළ යුතුව ඇත. ඒ සඳහා ආයතනයේ ඉහළ සිට පහළ දක්වා වූ කාර්ය මණ්ඩලය කුසලතාවලින් පරිපූර්ණය කළ යුතු වේ. මෙහිදී එක් එක් නිලධාරී කාණ්ඩයේ රාජකාරි ස්වභාවය අනුව ලබා දිය යුතු කුසලතාවය හඳුනාගෙන එම කුසලතාවයන් ප්‍රගුණ කිරීම සඳහා පුහුණු වැඩසටහන් හඳුනාගෙන ක්‍රියාත්මක කරනු ලබයි.

මෙම දෙපාර්තමේන්තුවේ දැක්ම මෙහෙවර අරමුණු ළඟාකරගැනීම සඳහා පැවරී ඇති කාර්යභාරය ඉටු කිරීමට අදාළව පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි.

ඒ අනුව දෙපාර්තමේන්තුවට යොමු කරනු ලබන සුළු වරදකරුවන් වැරදිවලින් මුදවාගෙන යහපත් පුරවැසියෙක් ලෙස සමාජගත කිරීම සඳහා නිලධාරීන්ට අවශ්‍ය දැනුම ලබා දීම සඳහා වන පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි. මෙහිදී පුද්ගලයින්ගේ චර්යාත්මක වෙනසක් ඇති කිරීම හා සමාජ සංවර්ධන කටයුතු සිදු කිරීමට අදාළ දැනුම ලබා දීම සිදු කෙරේ. එමෙන්ම දෙපාර්තමේන්තුවේ රාජකාරි කටයුතු නිසි පරිදි සිදුකර ගැනීමට අවශ්‍ය කාර්යාල කළමනාකරණයට අදාළ ධාරිතාවය සංවර්ධනය කිරීම සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි.

ඒ අනුව දෙපාර්තමේන්තුවේ කාර්යභාරය සාක්ෂාත් කර ගැනීම සඳහා 2025 වර්ෂයේ දී 6.4හි සඳහන් පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.

6.4 **මානව සම්පත් සංවර්ධනය**

අනු අංකය	වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	දින ගණන	සමස්ථ ආයෝජනය		වැඩසටහනේ ස්වභාවය (දේශීය/විදේශීය)	නිමැවුම/ලබාගත් දැනුම
				දේශීය	විදේශීය		
01	ආකල්ප හා පෞරුෂත්ව සංවර්ධන පුහුණු වැඩසටහන	40	දින 02	49,955.00		දේශීය	නිලධාරීන්ගේ දැනුම ආකල්ප හා පෞරුෂ සංවර්ධනය වීම
02	පරිගණක සාක්ෂරතාවය පිළිබඳ පුහුණු වැඩසටහන	42	දින 05	315,000.00		දේශීය	
03	මත්ද්‍රව්‍ය දුර්භාවිත ආශ්‍රාලාභීන් සඳහා සාක්ෂි පාදක ප්‍රතිකාර සහ නිවාරණ ක්‍රම පිළිබඳ පුහුණු වැඩසටහන්	362	දින 03	430,378.32		දේශීය	
04	නාට්‍යානුසාරයෙන් ප්‍රතිකාරාත්මක ක්‍රමවේදය යටතේ පුහුණුකරුවන් පුහුණු කිරීම	388	දින 03	423,879.50		දේශීය	
05	ප්‍රජා විශෝධන ක්‍රියාවලිය සහ එහි නව ප්‍රවණතා පිළිබඳ පුහුණු වැඩසටහන	115	දින 02	16,300.00		දේශීය	
06	12 පියවර පුහුණු වැඩසටහන (මත්ද්‍රව්‍ය භාවිතා කරන්නවුන් ඉන් මුදවා ගැනීමට)	74	දින 01	114,540.00		දේශීය	
07	නිලධාරීන්ගේ විෂයානුබද්ධ දැනුම සංවර්ධනය (පශ්චාද් උපාධි/ඩිප්ලෝමා)	6		380,000.00		දේශීය	
08	වෙනත් පුහුණු වැඩසටහන් (නවක නිලධාරී පුහුණු)	622		1,228,830.60		දේශීය	
එකතුව				**2,958,883.42**			

07 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්වය අනුකූල වේ/ අනුකූල නොවේ	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබීම**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිලධාරින්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම)	අනුකූල නොවේ	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් නැත	
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අනුකූල නොවේ	ගබඩා අත්තිකාරම් ගිණුම් නැත	
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අනුකූල වේ		
1.6	වෙනත්	-		
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ. 445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		

2.3	විගණන විමසීම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	යාවත්කාලීන කර ඇත	
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල නොවේ	අභ්‍යන්තර විගණන අංශයක් නොමැත	
2.5	සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛණය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GAN20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
03	**මූල්‍ය පාලන සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		

3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩ වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි පවරා දී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලස්ම සකස් කිරීම	අනුකූල නොවේ	අභ්‍යන්තර විගණන අංශයක් නොමැත	
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ		
6	**අභ්‍යන්තර විගණනය**			

6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව විගණන සැලස්ම සකස් කිරීම	අනුකූල නොවේ	ආයතනයේ විගණන අංශයක් නොමැත. අමාත්‍යාංශය හරහා ක්‍රියාත්මක වේ	
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුල දී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව සියලුම විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ	ආයතනයේ විගණන අංශයක් නොමැත. අමාත්‍යාංශය හරහා ක්‍රියාත්මක වේ	
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව සියලුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ	අභ්‍යන්තර විගණන අංශයක් නොමැත	
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ	අමාත්‍යාංශය හරහා ක්‍රියාත්මක වේ	2025 වර්ෂයේ කාර්තු 04 සඳහාම විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් පවත්වා ඇත.
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		

8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම.	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	මේ වනවිට භාණ්ඩ සමීක්ෂණ අවසන් කර නිර්දේශ ක්‍රියාත්මක කරමින් පවතී.	
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදු කිරීම	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	-	එවැනි වාහන නොමැත	
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන් ම මු.රෙ.103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		

9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධිවිධාන ප්‍රකාරව වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල්බදු කාලසීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. 94(1)ප්‍රකාරව,සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නො ඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම	අනුකූල වේ		
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්වලට අනුකූල වීම	අනුකූල වේ		

12.2	හිගහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිගහිටි ණය නිරවුල් කර තිබීම	අනුකූල වේ		
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂනය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය නිම වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල නොවේ		
14.3	මු.රෙ.371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කිරීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමග මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසිවලට අනුකූලව,රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූල නොවේ	දෙපාර්තමේන්තුවේ ආදායම් ගිණුමක් නොමැත.	
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නො කොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල නොවේ	දෙපාර්තමේන්තුවේ ආදායම් ගිණුමක් නොමැත.	
15.3	මු.රෙ.176 අනුව හිග ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ	දෙපාර්තමේන්තුවේ ආදායම් ගිණුමක් නොමැත.	

16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියළු සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියළු වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර,වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල නොවේ	මෙම දෙපාර්තමේන්තුව සඳහා වෙබ් අඩවියක් සකස් කර නොතිබුනු අතර වර්ෂ ගණනාවක් පුරා ඒ සඳහා ප්‍රතිපාදන ඉල්ලා තිබුණි. ඒ අනුව 2026 වර්ෂයේ අවශ්‍ය ප්‍රතිපාදන ලැබී ඇති අතර මේ වන විට වෙබ් අඩවිය සකස් කරමින් පවතී.	
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක/05 2008 හා 05/2018/(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ		

18.2	එම චක්‍රෙල්බයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චකුලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහා ම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නො අඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ථ කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල වේ		
19.4	ඉහත සඳහන් චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියකු පත් කොට තිබීම	අනුකූල වේ		
20	**විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		